හිතවත්..........................................................................................

ඔබගේ ජීවිතයට වසර 35ක් සපිරෙන මේ වසරේ මෙසේ ඔබ අමතන්නේ ඉතා වැදගත් පණිවිඩයක් ඔබ හමුවේ තැබීමටයි.

වයස් ගතවීමත් සමඟම විවිධ රෝගාබාධයන්ට ගොදුරු වීමේ අවදානම වැඩිවේ. පිළිකා රෝගී තත්ත්ව මේ අතරින් ප්‍රධාන තැනක් ගැනී.

ශ්‍රී ලංකාවේ පිළිකා වැළඳී මියයන කාන්තාවන් අතුරින් වැඩිම සංඛ්‍යාවක් මිය යන්නේ පියයුරු පිළිකා සහ ගැබ්ගෙල පිළිකා වැළඳීමෙන් බව ඔබ දන්නවාද?

මෙම පිළිකා දෙවර්ගය කල් ඇතිව හඳුනා ගැනීම මගින් එවැනි තත්ත්වයක් වලක්වා ගත හැකිය.

සුවනාරී සායනයකදී ඉතා සරල පරීක්ෂණයකට යොමු වීම තුළින් ගැබ් ගෙල පිළිකාව වැළඳීමට කලින් හඳුනා ගැනීමටත්, පියයුරු පිළිකාව කල් ඇතිව හඳුනා ගැනීමටත් හැකියාව ඇත. එපමණක් නොව **මෙම සායනයට පැමිණීම තුලින් ඔබට දියවැඩියාව හෝ අධි රුධිර පීඩනය වැළඳී තිබේදැයි පරීක්ෂා කර ගැනීමට අවස්ථාව ලැබීමද අමතර වාසියකි.**

රජය විශාල මුදලක් වැය කරමින් ඔබ සඳහා මෙම සියළුම සේවාවන් නොමිලයේ ලබාදීමට කටයුතු සලසා ඇත.

**............................................ මස ................................ දින ........................................................ ස්ථානයේ පැවැත්වෙන සුවනාරී සායනයට සහභාගී වී එම සේවාව ලබා ගන්නා ලෙස ආරාධනා කරමු.** මේ පිළිබඳව ඔබගේ ස්වාමි පුරුෂයා සමඟද සාකච්ඡා කිරීම වැදගත් බව අපගේ හැඟීමයි.

අදාල දින සායනය තුලදී ඔබ හමුවීමට අපි අපේක්ෂා කරමු.

...................................................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අතුළු කාර්ය මණ්ඩලය